ශීර්ෂය 267- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
-----------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය තුළ මූලධන වත්කම් මිල දී ගැනීමේ වියදම් අතර රු.4,394,851ක වෙනසක් පැවැතිණි. | භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර කඩිනමින් නිරවුල් කරනු ලැබේ. | භාණ්ඩාගාර පොත් සමඟ සසඳා ගිණුම් පිළියෙල කල යුතුය. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ජංගම නොවන වත්කම් වටිනාකම් අතර රු.22,539,817ක වෙනසක් පැවැතිණි. | නොනිමි වැඩ වාර්තා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් භාණ්ඩාගාර ආකෘති පත්‍ර මගින් සලසා දී නොතිබුණි. | - එම - |
| (ඇ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ජංගම නොවන වත්කම් වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ එම වත්කම්වල ආරම්භක ශේෂය අතර රු.5,811,266ක වෙනසක් පැවැතිණි. | වැරදි නිවැරදි කර ඇත. | - එම - |

(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම නොවන වත්කම්වල ඇතුළත් රු.8,589,845 ක වත්කම් ශේෂ හා ජංගම නොවන වත්කම්වලින් ඉවත්කර තිබුණු රු.1,210,995 ක වත්කම් ශේෂ වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමේ දෝෂ නිවැරදි කිරීම සඳහා ආරම්භක ශේෂයට රු.8,589,845 ක් එකතු කර ඇත. ඉවත් කළ වත්කම්වල විස්තර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් විගණනයට ඉදිරිපත් කෙරේ. | ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රමාණවත් හා සුදුසු සාක්ෂි විගණනයට ඉදිරිපත් කල යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 අග්‍රිම කළමනාකරණය
--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙනුවෙන් වූ රු.103,050,000ක අග්‍රිම, භාණ්ඩාගාරය විසින් නිකුත් නොකිරීම නිසා අනුමත කළ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කළ නොහැකිව පැවැතිණි. | රේඛීය අමාත්‍යාංශ උපදෙස් පරිදි ප්‍රතිපාදන ආපසු හරවා යැවීම නිසා භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබී නොතිබුණි. | ලද අග්‍රිම ප්‍රශස්ත ලෙස උපයෝජනය කළ යුතුය. |

2.2 වියදම් කළමනාකරණය
---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 02 කින් රු.250,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරුකර එදිනම එම වැය විෂයයන් වෙත රු.393,000 ක් ප්‍රතිපාදන මාරුකිරීම් මගින් ලබාගෙන තිබුණි. | ඔබගේ අදහස් සැලැකිල්ලට ගෙන ඉදිරියේදි මෙවැනි දෝෂ වැළැක්වීමට කටයුතු කෙරේ. | අවශ්‍යතාව නිසි පරිදි හදුනාගෙන ප්‍රතිපාදන මාරු කළ යුතු වීම. |

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
----------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකරනු ලබන කොන්ත්‍රාත් කාර්යයන්හි ගිවිසුම්වල පිටපත් මුදල් රෙගුලාසි 702(3) පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිටපත් විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූලධන හා පුනරාවර්තන වැය විෂයයන් 28 ක ප්‍රතිපාදන ඉතිරි වීම රු.20,061,107 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ත් සියයට 100 ත් අතර පරාසයක පැවැතිණි. | විවිධ චක්‍රලේඛ අනුව කටයුතු කිරීමට සිදු වීම, වසංගත රෝග තත්ත්වය, ගමනාගමන අපහසුතා, රැස්වීම් පැවැත්වීමට නොහැකි වීම වැනි හේතු නිසා ඉතිරිවීම් පැවැතිණි. | වෙන්කළ ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

**2.5** අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පුදුකුඩියිරුප්පු සහ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.3,256,460 ක ගෙවීම් 08 ක් මුදල් රෙගුලාසි 137 ප්‍රකාරව අනුමත නොකර ගෙවීම් සිදුකර තිබුණි. | මේ වන විට නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2.6 අත්තිකාරම් ගෙවීම් සහ නිරවුල් කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය අත්හිටවූ, සේවය හැරගිය, මියගිය හා විශ්‍රාමික සේවකයින්ගෙන් අයවිය යුතු වර්ෂ 05 ත් වර්ෂ 26 ත් අතර කාලයක් පැරණි රු.527,134 ක ශේෂයක් අයකර ගැනීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ **XXIV** පරිච්ඡේදයේ 4 වගන්තිය පරිදි පියවර ගෙන නොතිබුණි. | අයකිරීමට පියවර ගෙන ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | වී මිල දී ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014/15 කාල පරිච්ඡේදය තුළ ගොවි සමූපකාර සමිති 02 ක් වෙත ලබාදුන් රු.18,334,125 ක් මේ දක්වාම අයකර නොතිබුණි. | අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. | සියලු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

2.7 තැන්පතු ශේෂ

----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ තුනුක්කායි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එකතුව රු.1,800,000ක් වටිනා තැන්පතු 02ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නියමිත පරිදි නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) ඉඩම් මිල දී ගැනීමක් වෙනුවෙන් සී/ස ලංකා මිනරල් සැන්ඩ් සමාගම විසින් 2012 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදුන් රු.2,250,000 ක් අදාළ අරමුණු සඳහා භාවිතා නොකර පසුගිය වර්ෂ 09 කට වැඩි කාලයක සිට තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | මුල් අයිතිකරුවන් මිය ගොස් ඇති බැවින් ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් ප්‍රමාද වී තිබුණි. | අදාල අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 වත්කම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයේදී රු. 1,484,000කට තෙල් නිෂ්පාදන යන්ත්‍රයක් මිල දී ගෙන තිරුමුරුගන්ඩි ග්‍රාම සංවර්ධන සමිතියට භාර දී තිබුණද, එම යන්ත්‍ර මේ දක්වා උපයෝජනය කර නොතිබුණි. | විදුලිය සම්බන්ධතා ලද පසුව මෙම යන්ත්‍ර භාවිතා කළ හැකි බව දන්වා සිටිමි. | මෙම යන්ත්‍ර උපයෝජනය සඳහා නොපමාව අවශ්‍ය පියවර ගත යුතු වේ. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03කට ලබා දුන් වතුර බවුසර් 03ක් වර්ෂයකට වැඩි කාලයක සිටත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පැවැති ට්‍රැක්ටරයක් වර්ෂ 05ක වැඩි කාලයක සිටත් අභාවිතව පැවැතිණි. | භාවිතා කිරීමට පියවර ගනිමින් පවතී. | වත්කම් භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. |

3.2 පාඩු හා හානි
---------------

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ / ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කළ ඉදි කිරීම් ව්‍යාපෘතියක් නිම කිරීමට ප්‍රමාද වූ දින 154ක් වෙනුවෙන් රු.142,321ක ප්‍රමාද ගාස්තු අඩු නොකර ගෙවීම් සිදුකර තිබුණි. | සමාජ මට්ටමේ සංවිධාන දිරිගැන්වීමේ අරමුණින් දඩ ගාස්තු අයනොකර ගෙවීම් සිදුකර තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාදයන් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |

4. මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල පුරප්පාඩු 295ක් හා 119 දෙනෙකුගේ අතිරික්තයක් 2021 දෙසැම්බර් 31 දිනට පැවැතිණි. | ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | අවශ්‍යතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත්, අතිරික්තය ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් පියවරගත යුතු වේ. |
| (ආ) | මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්ත වූවන්ගේ පැමිණීම හා පිටවීම, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කර නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය අක්‍රීය වී ඇති නිසා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |